මන්මුනෙයි දකුණ ඉරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය
--------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි දකුණ ඉරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය, මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
---------------------------------------------------------------

රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව නිසිපරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව වන රු. 16,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී (UNOPS) ආයතනයෙන් පරිත්‍යාගයක් වශයෙන් ලැබුණු කාණ්ඩ වාහන 3 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

(ඇ) අත ඉතිරි භාණ්ඩ වල රු. 47,419 ක එකතු වටිනාකම ඇති පොදු පාරිභෝජණ භාණ්ඩ සහ විදුලි උපකරණ 1989 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වශයෙන් වෙන්කර තිබුණද, ඒවා පොත්වලින් කපාහැරීමට කටයුතු නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවල අත ඉතිරි තොගය වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ස්ථාවර තැන්පත් සඳහා ලද පොලී ආදායම් වන රු. 51,584 ක් ගිණුම් වලට ගෙනවිත් නොතිබුණි.

1.3.4 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කලවාන්චික්කුඩි පොදු වෙළඳ පොළ ගොඩනැගිලි සංකීර්ණයේ කඩ කාමර 19 ක් බදු ගෙන තිබූ අයගෙන් 1991 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල හිඟ බදු මුදල රු. 92,676 ක් අයකර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සභාව විසින් නඩත්තු කරන දෛනික පොළෙහි පිහිට කඩකාමර 08 ක සඳහා 1985 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව රු. 3,110,486 ක හිඟ බදුකුලිය අයකර ගැනීම සඳහා කටයුතු නොකර ගිණුම් ප්‍රකාශනවල දිගටම පෙන්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබියයුතු මුදලක් ලෙස රු. 167,580 ක් මූල්‍ය ප්‍රකාශනවල 1989 වර්ෂයේ සිට දිගටම පෙන්වමින් තිබුණද එය අයකර ගැනීමට හෝ ගිණුම්වලින් කපා හැරීමට විගණන දිනය වන 2015 ජුනි 30 දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

එකතු වටිනාකම් රු. 85,211,170 ක්වූ ඉඩම් ගොඩනැගිලි, යන්ත්‍ර යන්ත්‍රොපකරණ යනාදිය සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් විගණය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.

1.3.6 නීති, රීති, රෙගුලාසි කළමණාකරණ තීරණ යනාදියට අනුකුල නොවීම

---------------------------------------------------------------------------

පහන සඳහන් නීති සහ රීති වලට අනුකුල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ශනය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 වර්ෂයේ ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) පරිච්ඡේදය 1 වගන්තිය 5 (XII) | මුදල් සහ ගබඩා ද්‍රව්‍ය යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදීද ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | පරිච්ඡේදය X වගන්තිය 193 | වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අයවැය ලේඛනය සමඟ සංසන්දනය කර විචලනයන් සඳහා හේතු දක්වන විස්තර ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | රජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත්කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකරන ලද මාස 06 ක් ඉක්මවූ රු. 169,564 ක් වටිනා චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව විගණන දිනය දක්වා කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | අංක පීඑෆ්/437දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛන | වාහන සඳහා රක්ෂණ ආවරණ ජාතික රක්ෂණ භාර අරමුදලක් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබාගතයුතු වුවද, එයට පටහැනිව වාහන 06 ක රක්ෂණ ආවරණ පුද්ගලික රක්ෂණ ආයතයෙන් රු. 7,450 ක් ගෙවා ලබාගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තික වියදම් ඉක්මවූ ආදායම් රු. 6,714,577 ක්වූ අතර, එම සැසඳීමේදී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 4,371,982 ක්වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු. 2,342,595 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලන
---------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්‍ය සාධනය
--------------------------------------

(අ) සන්නිවේදන කුළුන සඳහා ගාස්තු අයකිරීම්
-----------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් ආදායම් අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීමට නොහැකිවීම හේතුවෙන් සහා බලප්‍රදේශයේ පුද්ගලික සන්නිවේදන ආයතනවලින් ස්ථාපිත කර තිබූ සන්නිවේදක කුළුන 12 ක් සඳහා ස්ථාපිත ගාස්තු යන වාර්ෂික බලපත්‍ර ගාස්තු වශයෙන් අයකර ගත හැකිව තිබූ රු. 792,000 ක වාර්ෂික ආදායමක් අහිමිවී තිබුණි.

(ආ) වරිපනම් බදු
--------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134, 158 සහ 159 වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි ඉඩම්, ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි යනාදිය සඳහා 2014 වර්ෂය සඳහා වරිපනම් බදු තක්සේරුකර අයකර ගැනීම සඳහා විගණන දිනය වන 2015 ජුනි 30 දක්වා සභාව විසින් කටයුතුකර නොතිබුණි.

(ඇ) මුද්දර ගාස්තු

--------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ දුර්වලතා

-----------------------------

(අ) සභාව සතු ආයුර්වේද රෝහලට ආයුවේද වෛද්‍ය වරයෙකු සහ බෙහෙත් සංයෝගකයෙකු පත්කිරීම සඳහා 2012 වසරේදී භාණ්ඩාගාරය අනුමැතිය ලැබී තිබුණද වෛද්‍ය වරයෙකු පත්කර මහජනය වෙත සේවා සැපයීම සඳහා විගණන දිනය වන 2015 ජුනි 30 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනත් අනුව සමාලෝචිත කාල පරිච්ඡේදයේ දෛනික වැටුප් පදනම් යටතේ පත්කර තිබූ සේවකයන් පහලොස් දෙනෙකු සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් රු. 75,852 ක් සහ සේවක භාරකාර අරමුදල දායක මුදල රු. 11,375 ක්ද අදාල අරමුදල් වලට යැවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) 1975 වර්ෂයේ පළාත්පාලන විශ්‍රාම වැටුප් රීති සහ 1978 ජූන් 07 දිනකි 320/8 අංක දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ප්‍රාදේශිය සභාවේ සෙවකයින් පස් දෙනෙකුගෙන් අයකර ගෙන තිබූ විශ්‍රාම වැටුප් දායක මුදල් එම සේවකයන් වෙනුවෙන් සභාව විසින් ගෙවියයුතු විශ්‍රාම වැටුප් දායක මුදලද ඇතුළුව රු. 1,311,298 ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමෙන්තුවට යැවීම සඳහා 2015 ජුනි 30 දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) වෙනත් අමාත්‍යාංශය දෙපාර්තමෙන්තු සහ ආයතනවලින් සභාව වෙත ලබා දෙන ලද මෝටර් රථ 04 ක අයිතිය සභාවේ නමට මාරුකිරීම සඳහා වර්ෂ 03 ක සිට කටයුතු කර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-----------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගත යුතු බව පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දින අංක 03 දරණ පළාත් පාලන ආයතන ප්‍රතිසංස්කරන චක්‍රලේඛ අංක 08 හි සඳහන් පරිදි අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා නොතිබුණි.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය